Department of Education, Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල**

**විෂය - නාට්‍ය හා රංග කලාව**

**සතිය 45**

**12 ශ්‍රේණිය**

**Prepared by : Tharanga D Gunarathna**

**නිපුණතාවය 6.0/ නිපුණතා මට්ටම6.1/ විවිධ ඇත්දැකීම් පාදක කොටගෙන නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරයි**

**පාඩම : භූමිකාවක් යනු කුමක්ද?**

**<u>I කොටස</u>**

**ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා වඩාත් නිවැරදි වරණය තෝරන්න.**

01. භූමිකාවක් යනු,
1. චරිත කිහිපයකි
2. චරිතයක හැසිරීමකි
3. චරිතයක අභ්‍යන්තර සමාරෝපයයි
4. නළුවාගේ හැඟීම්‍ය
5. චරිතයක එක් පැතිකඩකි

02.මනමේ කුමරියගේ චරිතය තුල දැකිය හැකි භූමිකාවක් නොවන්නේ,
1. තක්සලාවේ ඇදුරුතුමාගේ දියණිය
2. කුමාරයාගේ ආදරයට පාත්‍ර වූ පෙම්වතිය
3. කුමරාගේ විවාහක බිරිඳ
4. සිංහයාගෙන් බේරී ගල් ලෙනෙන් පලා යන කුමරිය
5. වැදි රජුගේ ආකර්ශණයට ගොදුරු වූ කුමරිය

03.භූමිකාවක් ප්‍රතිනිර්මාණය කිරීමේදී නළුවා විසින් චරිතයට ප්‍රවේශ වීම,
1. අනුකරණයයි
2. සමාරෝපයයි
3. අනුරූපණයයි
4. පරිකල්පනයයි
5. නිර්මාණාත්මක බවයි

04.ඉහත ප්‍රවේශ වීමේ කාර්ය ආකාර 2කි.එනම්,
1. අනුකරණය හා සමාරෝපයයි
2. අනුරූපණය හා අනුකරණයයි
3. බාහිර හා අභ්‍යන්තර සමාරෝපයයි
4. අභ්‍යන්තර සමාරෝපය හා ක්ෂණික නිරූපණයයි
5. බාහිර සමාරෝපය හා අනුකරණයයි

05.භූමිකා රංගනයේ යෙදීමෙන් පුද්ගලයාගේ,
1. සෞඛ්‍ය වර්ධනය වේ
2. චින්තනය හා නිර්මාණාතමක කුසලතාව වර්ධනය වේ
3. ශාරීරික නම්‍යශීලී බව ලැබේ
4. මානසික ඒකාග්‍රතාවය ලැබේ
5. ශරීරය සැහැල්ලු වේ

**ප්‍රශ්න අංක 06සිට 10 දක්වා හිස්තැන් වලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න**
**(නළු නිළි,භූමිකා,සමාරෝපනය,සමාජ අත්දැකීම්,නළු පෞරුෂය)**

06.විවිද භූමිකා පිළිබඳ ඇති..........................නිර්මාණයේ සාර්ථකත්වයට වැදගත් වේ.

07.භූමිකාවක් ප්‍රතිනිරූපණය කිරීමේදී .............................සිදුවේ.

08.සාර්ථක නාට්‍ය පෙළක් ගොඩනැගීම සඳහා එහි අන්තර්ගත චරිත තුල විවිධ.............................. අතර ගැටීම ප්‍රබල විය යුතුය.

09.සාර්ථක භූමිකා රංගනයක් සඳහා ........................තිබිය යුතුය.

10.භූමිකා නිරූපණයේ සුවිශේෂීතමයා .............................යන්ය.

**සියලුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.**

01.භූමිකාවක් යනු කුමක්ද?

02.භූමිකාවක ඇති බාහිර හා අභ්‍යන්තර ලක්ෂණ මොනවාද?

03.නිර්දිෂ්ට නාට්‍ය පෙළක චරිතයක් තෝරා ගෙන එහි ඇති භූමිකාවන්හි ස්වරූප වෙන් වෙන්ව විස්තර කරන්න.